# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2126/34 - 2019 ජුනි මස 04 වැනි අඟහරුවාදා - 2019.06.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* ඇප්‍රාලේ/05/05/14/2011/01.
*ඔබේ අංකය :* 4/3/6/2011/එඩබ්/108.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළේ, බටකඩ ග්‍රාම නිලධාරි වසමේ පලාවෙල නමැති ගමේ,

සැලැස්මේ අංකය :- අ. ග. පි. 60, අතිරේක අංක 15

**කැබලි අංක 123**

ඉඩමේ නම: - දියකඩගාව අළුත්වත්ත; හිමිකම් කියන්නා: රජය (ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අත්කර ගෙන ඇත; මුල්හිමිකම් කියන්නා: පලාවෙල උඩ නිරිඇල්ල පදිංචි අසංකා වීරසූරිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0075

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 ජූලි මස 17 වැනි දින පෙ. ව. 10.00ට ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 ජූලි මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් සනාථ කිරීම සඳහා ලිපි ලේඛන එදිනට මා වෙත ඉදිරිපත් කළ යුතුය.

එස්. ඒ. දිල්රුක්,
ප්‍රාදේශීය ලේකම්,
ඇලපාත.

2019 මැයි මස 29 වැනි දින,
ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 563

---

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය:* 6/3/7/15/15/1.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* LD/05/2007/MV/300.

මොරගහකන්ද/කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන

බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර* :

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගහල පල්ලේසිය පත්තුවේ මොරගොල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2019.05.07 දින සම්මත කරන ලද අ. ග. පි. 533, අතිරේක අංකය 4, පත්‍රය 3 දරන සැළසුමේ පෙන්නුම් කර ඇති පහත විස්තර සදහන් ඉඩම් කොටස්.

1. **කැබලි අංක** 271
ඉඩමේ නම: - මරක්කයකොටුව කුඹුර, මරක්කය කොටුව; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: මොරගොල්ල පදිංචි ආගරපොල ගෙදර කිරිබණ්ඩා මයා හිමිකම් කියයි, මොරගොල්ල පදිංචි ඒ. ජී. වසන්ත සමන් කුමාර මයා විසින් භුක්ති විදියි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1616.

2. **කැබලි අංක** 272
ඉඩමේ නම: - මරක්කයකොටුව කුඹුර, මරක්කය කොටුව; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: මොරගොල්ල පදිංචි හේනයලෑ ගෙදර පටයා හේනයා මයා හිමිකම් කියයි, මොරගොල්ල පදිංචි ඒ. ජී. ඉන්ද්‍රජිත් සුරේන්ද්‍ර සෝමපාල මයා විසින් භුක්ති විදියි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2079.

3. **කැබලි අංක** 273
ඉඩමේ නම: - මරක්කයකොටුව කුඹුර, මරක්කය කොටුව; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය, මොරගොල්ල පදිංචි අලුත් ගෙදර එමලින් විසින් බලපත්‍රයක් මත වගා කරන ලදී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2665.

4. **කැබලි අංක** 274
ඉඩමේ නම: - මහවෙල කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: මොරගොල්ල පදිංචි ජී. එච්. චන්ද්‍රකාන්ත හේවගේ මයා හිමිකම් කියයි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0944.

**කැබලි අංක** 275
ඉඩමේ නම: - මහවෙල කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: මොරගොල්ල පදිංචි ආගරපොල ගෙදර හීංබණ්ඩා මයා හිමිකම් කියයි, මොරගොල්ල පදිංචි ඒ. ජී. ගාමිණී විජේවර්ධන මයා විසින් භුක්ති විදියි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2193.

**කැබලි අංක** 276
ඉඩමේ නම: - මහවෙල කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: මොරගොල්ල පදිංචි අලුත් ගෙදර හොරතලා මයා හිමිකම් කියයි, මොරගොල්ල පදිංචි ඒ. ජී. ජේම්ස් මයා විසින් භුක්ති විදියි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1832.

**කැබලි අංක** 277
ඉඩමේ නම: - මහවෙල කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: මොරගොල්ල පදිංචි එච්. එම්. ධර්මසේන මයා හිමිකම් කියයි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1368.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 ජුනි මස 26 වැනි දින පු. භා. 9.00 ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 ජුනි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආත්මා දිලුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2019 මැයි මස 29 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 564

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.